www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපති අස්ථාවර සුළුතර ආන්ඩුවක් පිහිටුවයි

## Sri Lankan president installs unstable minority government

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2005 දෙසැම්බර් 08**

පසු ගිය මස අවසන ශ්‍රී ලංකාවේ නව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පිහිටුවනු ලැබූ සුළුතර ආන්ඩුව ගැඹුරු දේශපාලනික අස්ථාවරභාවයේ සලකුනකි. ආසන 225කින් සමන්විත පාර්ලිමේන්තුවේ ආසන 70ක් පමනක් හිමි ඔහු සිය මැතිවරන ව්‍යාපාරයට සහාය ලබා දුන් සිංහල ස්වෝත්තමවාදී පක්ෂ දෙකේ - ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජහෙඋ) - සහාය මත මුලුමනින් ම රැඳී සිටියි.

කැපී පෙනෙන සිද්ධියක් ලෙස, පෙර එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ කොටසක්ව සිටි ජවිපෙ රාජපක්ෂ දිනවීමේ දී ප්‍රධාන භූමිකාවක් ඉටු කල ද කැබිනෙට්ටුවට එක් වීම ප්‍රතික්ෂේප කලේ ය. වාචාල ජනතාවාදී ආයාචනා මත යැපෙන මෙම පක්ෂය 2004 දී මුල් වරට පාලක සභාගයකට එක් වීමෙන් අනතුරුව පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සිය පදනම වේගයෙන් අහිමි කර ගත්තේ ය.

අතිශයින්ම අස්ථාවර වන නමුදු, එජනිස ආන්ඩුවට, ජවිපෙ මන්ත්‍රීවරු 39ක සහ ජාහෙඋ මන්ත්‍රීවරු 10න් 9ක සහයෝගය ඇතිව පාර්ලිමේන්තු බහුතරයක් තිබේ. රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සතුව තිබෙන්නේ මන්ත්‍රීවරු 60ක් පමනකි. ඉතුරු ආසන 10ය පැමිනෙන්නේ මුස්ලිම් පදනමක වන ජාතික එක්සත් සන්ධානය (ජාඑස), ලංකා සම සමාජ පක්ෂය (ලසසප), ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (කොප) සහ ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) ඇතුලු එජනිස හවුල්කාරයන්ගෙනි.

එජනිසයට විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂයෙන් (එජාප) සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් (ශ්‍රීලමුකො) බිඳී ගිය මන්ත්‍රීවරු අතලොස්සක් ද ඇතුලත් වෙයි. බොහෝ විටම මුදල්මය හෝ දේශපාලනමය පෙලඹවීම් සහිත "පිල් මාරුවේ" ක්‍රියාවලිය ශ්‍රී ලංකාව තුල මනාව එලි පෙහෙලි වූ මාවතක් වන අතර එය දෙපැත්තට ම සිදු විය හැකි දෙයක් බව රාජපක්ෂ හොඳින් දනියි. එහි ප්‍රතිඵලයක් ලෙස පාලක සභාගයේ සෑම සියලු මන්ත්‍රීවරයාම පාහේ ඔහුගේ කැබිනෙට්ටුවට ඇතුලු කර ගෙන තිබෙන්නේ ආන්ඩුව පැත්තේ රැඳී සිටීම තුල සියලු දෙනාට ම වාසියක් වන ලෙසින් ය.

රාජපක්ෂ කැබිනට් ඇමතිවරු 25ක්, කැබිනට් නොවන ඇමතිවරු 26ක් හා නියෝජ්‍ය ඇමතිවරු 29ක් ලෙස එජනිස මන්ත්‍රීවරු 70 දෙනාට තනතුරු 80ක් ලබා දී තිබේ. ශ්‍රීලනිප මන්ත්‍රීවරු 60න් 58 දෙනෙකුට කවර ආකාරයක හෝ ඇමති තනතුරක් ලැබී ඇති අතර කීප දෙනෙකුට එකකට වඩා ලැබී තිබේ. ශ්‍රීලනිප මන්ත්‍රීවරු දෙදෙනෙකුට පමනක් තනතුරු කිසිවක් ලැබී නැති අතර පලමුවැන්නා, ඝාතනය කරනු ලැබූ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර්ගේ ආසනයට තව මත් රූපිකව කෙනෙකු පත් කර නැති නිසා වන අතර දෙවැන්නිය ජනාධිපතිගේ හිස්වූ අසුනට පත් කල ඔහුගේ ලේලිය වන නිරූපමා රාජපක්ෂ ය.

එජනිස මන්ත්‍රීවරුන්ට එල්ලී සිටින්නා සේ ම රාජපක්ෂ තම කන්ඩායම වැඩි කර ගැනීමට ද පැහැදිලිව ම විමසිලිමත්ව සිටී. විපක්ෂ එජාපයෙන් මන්ත්‍රීවරු ඇද ගැනීමට හෝ ආන්ඩුවට විධිමත්ව එක් වීමට ජවිපෙ දිරිමත් කිරීමට හෝ රාජපක්ෂ එලඹෙන සති මාසවල දී වඩ වඩාත් ඇමති තනතුරු නිර්මානය කල ද එය පුදුමයක් නොවනු ඇත.

ජනාධිපතිවරයා ඒ සමගම ප්‍රධාන ඇමති තනතුරු මත දැඩි ග්‍රහනයක් තබාගෙන සිටී. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) න්ට එරෙහිව වැඩි ආක්‍රමනශීලී පිලිවෙතක් උදෙසා ජවිපෙ සහ ජහෙඋ බැකිම ඇතිව උද්ඝෝෂනය කල රාජපක්ෂ ආරක්ෂක ඇමති මෙන්ම මුදල් ඇමති ලෙස ද තමාව ම නම් කර ගෙන සිටී. එසේම ආරක්ෂක ලේකම්, එනම්, ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලන අධිපතියා ලෙස රාජපක්ෂ විසින් සිය සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ පත් කලේ ය.

ජනාධිපතිවරයා විසින් චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිවරියගේ ප්‍රමුඛ සහායකයින් හිතාමතාම කොන්කර තිබේ. වඩාත්ම කැපී පෙනෙන්නේ ඇයගේ සොයුරු අනුර බන්ඩාරනායක ය. මැතිවරන ව්‍යාපාරය තුල දී ඔහු මහ ව්‍යාපාරිකයන් සහ මහ බලවතුන්

පක්ෂපාතී වූ "සාම ක්‍රියාවලියට" හානි වන්නේ යයි ජවිපෙ සහ ජහෙළ සමග රාජපක්ෂගේ එකඟතාවයන් ප්‍රසිද්ධියේ විවේචනය කලේ ය.

ශ්‍රීලනිප මධ්‍යම කාරක සභාව පෙර දී බන්ඩාරනායකව අගමැති තනතුරට නම්කර තිබුන ද ඔහුට එය නොලැබින. එසේ ම ඔහුව විදේශ ඇමති ලෙස යලි පත් නොකෙරුන අතර සංචාරක ඇමති ලෙස සාපේක්ෂව සුලු තනතුරකට පත් කෙරින. ඒ හා සමාන ම හේතූන් නිසා කුමාරතුංග හිතවතකු වූ සරත් අමුනුගම මුදල් ඇමති තනතුරින් ඉවත්කර රාජ්‍ය පරිපාලන ඇමති ලෙසට මාරු කර යැවින.

දින ගනනක වෙච්ලුම්කැම්වලින් පසු, ජවිපෙ හා ජාහෙළ සහයෝගය දිගට ම තබාගැනීමේ පැහැදිලි වෙට්ටුවක් ලෙසට රාජපක්ෂ විසින් අගමැති ලෙස රත්නසිරි වික්‍රමනායකව පත් කරනු ලැබී ය. එල්ටීටීඊයට එරෙහි සිය දැඩි මතධාරිත්වය සහ බෞද්ධ ධූරාවලිය සමග සමීප සබඳතා පිලිබඳව වික්‍රමනායක ප්‍රකට ය. ඉතා වැදගත් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ධූරය ද ඔහුට පැවරින.

වික්‍රමනායකව අගමැති ලෙස තෝරාගත් ජනාධිපතිවරයාට අගමැති තනතුර අවශ්‍යව සිටි ප්‍රධාන සහයෝගීකරුවන්ට හිලව් ගෙවීමට සිදු විය. රාජපක්ෂගේ මැතිවරන ව්‍යාපාරය මෙහෙය වූ මංගල සමරවීර විදේශ ඇමති මෙන් ම වරාය හා සිවිල් ගුවන් සේවා ඇමති ධූර ද සඳහා නම් කෙරින. ඉතාම ජ්‍යෙෂ්ඨ ශ්‍රීලනිප සාමාජිකයාව සිටියදී ම තමාව නොසලකා හැරියේ යැයි ඩී. එම්. ජයරත්න පැමිනිලි කල විට ඔහුට ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ලෙස අතිරේක තනතුරක් පැවරුවේ ය.

රාජපක්ෂගේ මැතිවරන ව්‍යාපාරයේ තවත් ප්‍රධානියෙකු වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේට වෙලඳ වානිජ පාරිභෝගික කටයුතු සහ අලෙවි ප්‍රවර්ධන ඇමතිකමට අමතරව මහා මාර්ග ඇමතිකම ද ලබා දුනි.

නොවැම්බර් 23 දා නව කැබිනට්ටුව පත් කල ගමන් ම නව නිපුනතා සංවර්ධන සහ රැකියා ප්‍රවර්ධන ඇමති ශ්‍රීපති සූරියආරච්චි ඉල්ලා අස් විය. රාජපක්ෂ ඔහු වහාම ව්‍යාපාර සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය ඇමති ලෙස පත් කලේ ය. තනතුරු දෙක බැගින් දරන කැබිනට් ඇමතිවරු හතර දෙනෙක් සිටින අතර නියෝජ්‍ය ඇමති තනතුරු ද දරන කැබිනට් නොවන ඇමතිවරු 12 දෙනෙක් සිටිති.

පැරනි, බොහෝසෙයින් අක්‍රිය ''කම්කරු'' පක්ෂවලට - ලසසප සහ කොප - පෙර තුබූ තනතුරුවලින් සෑහීමකට පත් වීමට සිදු විය ලසසපයට මන්ත්‍රීවරයෙකු සිටින්නේ 2004 මහ මැතිවරනයෙන් පසුව ඔවුන්ට එජනිස ජාතික ලැයිස්තුවෙන් තැනක් ලබා දුන් නිසා ම පමනි. කොපට තෝරා පත් කෙරුනු හා ජාතික ලැයිස්තුවෙන් පැමිනි වශයෙන් මන්ත්‍රීවරු දෙදෙනෙක් සිටිති. දශක ගනනාවක් තිස්සේ ශ්‍රීලනිප සංවිධානවල කොටසක්ව පවතින මේ පක්ෂ දෙකෙන් එකක් වත් ස්වාධීන දේශපාලන පක්ෂ ලෙස බැරෑරුම්ව සැලකිය නොහැක.

මේ ඇමතිවරු සියල්ලට ගෙවීම සඳහා මහජන මුදල් විශාල කන්දරාවක් අවශ්‍ය වෙයි. සිය පඩිනඩි මෙන් ම සෑම අයෙකුට ම නිල නිවසක්, වාහනයක්, පෞද්ගලික සහ නිල සේවක මඬුල්ලක් ද තවත් නිල හිමිකම් ද සතු ය. සෑම ඇමතියෙකු ම දැනට දරන වැටුපෙන් තුනෙන් පංගුවක විශ්‍රාම වැටුපකට හිමිකම් කියයි. මීට අමතරව, සෑම කෙනෙකුට ම ඇමති ආරක්ෂක අංශයේ විශේෂ පුහුනු කොමාන්ඩෝ ආරක්ෂකයකු ද හිමි ය.

මහජන පිලිකුලෙන් බේරීමේ වෑයමක් ලෙස ජවිපෙ මුල දී මන්ත්‍රීවරුන්ට ඇමති තනතුරුවලින් හිලව් ගෙවීම් හෙලා දැක්කේ ය. ජවිපෙ නායකයන් රාජපක්ෂට කැබිනෙට්ටුව කප්පාදු කරන ලෙස පෙලඹීම් කරන අතරේ ම බෝට්ටුව පැද්දේ යයි හනි හනික සිය විවේචන අකුලා ගත්හ.

මන්ත්‍රීවරුන්ගේ දූෂිත භාවය සහ ඇමති තනතුරුවලට ඇති කෑදරකම පිලිබඳව කොලඹ මුද්‍රිත මාධ්‍ය කලකට වරක් වැලපේ. එහෙත් එය දේශපාලන ස්ථාවරත්වයේ ඡායා මාත්‍රයක් සඳහා ගෙවිය යුතු මිල ලෙස පාලක ප්‍රභුව වටහා ගෙන සිටී.

දෙසැම්බර් 1 දා ඩේලිමිරර් කතුවැකියක් මෙසේ සලකුනු කලේ ය. ''ජනාධිපති රාජපක්ෂ කැබිනට් තනතුරු කප්පාදු කිරීමට අසමත් විය. ඔහුගේ අසීරුතාවයන් තේරුම්ගත හැකි ය. ඔහුට සමස්ත පරාසයක පක්ෂ සහ කන්ඩායම්වල අභිලාෂයන් තෘප්ත කිරීමට සිදු වී තිබේ. විශේෂයෙන් ම ඔවුන්ගෙන් කිසිවෙකුත් අමනාප කර ගැනීම ඔහුට දරා ගත නොහැක්කේ සිය ආන්ඩුව පාර්ලිමේන්තුවේ පවත්වාගෙන යාම අති සීරුවෙන් කල යුතු තුලිත තාවයක් වන බැවිනි.''

ආන්ඩුවේ අබල දුබල ස්වභාවය ගලා එන්නේ සරලව රාජපක්ෂගේ සහ ඔහුගේ ඇමතිවරුන්ගේ පෞද්ගලික දෝෂයන්ගෙන් නොව පාලක පන්තිය සමස්තයක් ලෙස මුහුන දෙන පාලනය කල නොහැකි දේශපාලනික උභතෝකෝටිකයන්ගෙනි.

කොලඹ සංගත ප්‍රභුවට දිවයිනේ 20 අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීම පිනිස එල්ටීටීඊය සමග සාකච්චාවෙන් එලඹෙන බලය බෙදීමේ සැලැස්මක් සහ ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ වේගවත් ක්‍රියා මාර්ගයක් අවශ්‍ය ය. කෙසේ වෙතත්, ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක ම - ශ්‍රීලනිප සහ එජාප - කම්රු පන්තිය බෙදීමටත් තම පාලනය පවත්වා ගෙන යාමටත් සිංහල

ස්වෝත්තමවාදය ඇවිස්සීම මත දිගුකලක් තිස්සේ දේශපාලනිකව රැඳී සිටියේ ය.

සාම කථාවන් පොරොන්දු වෙන ගමන් ම ජවිපෙ හා ජාහෙඋ පිනවීමට එල්ටීටීඊයට එරෙහිව දැඩි පිලිවෙතක් ගනිමින් රාජපක්ෂ දැනට මත් අතුරක ගමන් කරයි. දැනට මත් පුලුල්ව පැතිරුනු විරෝධයක් ජනිත කර තිබෙන සිය පෞද්ගලීකරනයේ සහ වියදම් කප්පාදුවේ ක්‍රියා මාර්ගය දිගට ම කර ගෙන යන ලෙසට, ව්‍යාපාරිකයන්ද, ඒ සමග ම ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද යොදන පීඩනයට එජනිස ආන්ඩුව හසුව සිටී. අති මහත් සේ අස්ථාවර වූ මෙම ආන්ඩුවට වැඩි ආයුශක් තිබිය නොහැක.

© www.wsws.org